SECURITIES AND EXCHANGE COMMISSION OF SRI LANKA

LIBRARY COPY

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 2009 අංක 47 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2009 සැප්තැම්බර් මස 22 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2009 සැප්තැම්බර් මස 25 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

මිළ : රු. 1.50 යි. තැපැල් ගාස්තුව : රු. 5.00 යි.

# 2009 අංක 47 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2009 සැප්තැම්බර් මස 22 වන දින]

එල්. ඩී.—ඕ. 23/2008.

**1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

1. මේ පනත 2009 අංක 47 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා (සංශෝධන) පනත යනුවෙන් සඳහන් කරනු ලැබේ.

1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 3 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ (ii) වන අනු ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අනු ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(ii) කොමිෂන් සභාවේ බහු ක්‍රියාකාරී අංග පිළිබිඹු කිරීම සඳහා නීතිය, මූල්‍ය, බැංකුකරණය හෝ ව්‍යාපාර යන ක්ෂේත්‍රවල වෘත්තීය ප්‍රවීනත්වය, පෘථුල පළපුරුද්ද සහ ඔප්පුකරන ලද දක්ෂතාවය සහිත පෞද්ගලික අංශයෙන් අන්තර්ග්‍රහනය කරගත් වෙනත් තැනැත්තන් හය දෙනකු;"

ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුලත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(ඇඇ) ලැයිස්තුගත පොදු සමාගම් සඳහා සාමාන්‍ය හෝ විශේෂ විධාන කලින් කල නිකුත් කිරීම."

ප්‍රධාන ප්‍රඥප්තියේ 55 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 55 වන වගන්තියේ "සුරැකුම්පත්" යන අර්ථකථනය සඳහා පහත දැක්වෙන අර්ථකථනය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

" "සුරැකුම්පත්" යන්නෙන්, යම් ආණ්ඩුවක් විසින් හෝ සංස්ථාගත කළ හෝ සංස්ථාගත නොකළ යම් මණ්ඩලයක් විසින් හෝ නිකුත් කරන ලද නැතහොත් නිකුත් කිරීමට

2-PL 004174 —3,490 (2009/07)

යෝජිත, යම් අයිතිවාසිකමක්, වරණයක් හෝ (ඒකක වශයෙන් හෝ අන්‍යාකාරයකින් හෝ විස්තර කරන ලද්දේ වුව ද) එහි හෝ ඒ පිළිබඳ සම්බන්ධතාවයක් ද ඇතුළුව, ණයකර, ව්‍යාපාර වස්තු, කොටස්, අරමුදල්, බැඳුම්කර, පාදක කොටගත් විශ්වාසය රඳවා ගනු ලැබූ වත්කම්වල ස්වභාවය කුමක් වුව ද අනාගතකරණයන් සහ වරණයන් ද ඇතුළුව ව්‍යුත්පන්න හෝ නෝට්ටු හෝ සුරැකුම්පත් යනුවෙන් සාමාන්‍යයෙන් හඳුන්වනු ලබන වෙනත් යම් සාධන පත්‍රයක් අදහස් වන අතර, විනිමය බිල් පත්‍රයක් හෝ බැංකුවක් විසින් නිකුත් කරන ලද පොරොන්දු නෝට්ටුවක් හෝ තැන්පතු සහතිකයක් ඊට ඇතුළත් නොවේ ;".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

5. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.